# ස්වයං අධ්‍යයනයට අත්වැලක්

1. ශ්‍රේණිය -09

2. වාරය -දෙවන වාරය

3. නිපුණතා මට්ටම - 5.3 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායය ප්‍රවර්ධනයට දායක වූවන් අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි.

4. ක්‍රියාකාරකම - 5.3 නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායක වූ නර්තන ශිල්පීන් අගයමු.

(විල්සන් ඔලබොඩුව ගුරුතුමා,අර්නෝලිස් ඉඹුල්ගොඩ ගුරුතුමා)

# ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායය ප්‍රවර්ධනයට දායක වූ නර්තන ශිල්පීන්



සැකසුම - ඩී. වී. අයිරාංගනී

මප/ වත/ රජවැල්ල කනිෂ්ට විද්‍යාලය

මෙහෙයවම - නර්තන අංශය

කලාප අධ්‍යාපන කාර්යාලය

වත්තේගම

**උපදෙස්**-: මෙය ලිඛිත පාඩමකි.මෙම පාඩම වැඩිදුරටත් අධ්‍යයනය කිරීම සදහා ඔබේ පාසලේ ගුරු ඇසුර ලබා ගත යුතුය.

**හැදින්වීම**-: ලාංකීක නර්තන පද්ධතීන් විශ්ව කීර්තියට පත් කිරීම සදහා දේශීය විදේශීය වශයෙන් නර්තන ශිල්පීන් දැක්වූ දායකත්වය බොහෝ ය.

ඉහත ශ්‍රේණීවල දී ඔබ ඉගෙනගත් නර්තන ශිල්පීන්ට අමතරව 9 ශ්‍රේණියේ දී ඔබට අර්නෝලිස් ඉඹුල්ගොඩ මහතා සහ විල්සන් ඔලබොඩුව මහතා යන දෙදෙනා නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායක වූ ආකාරය පිළිබද තොරතුරු මෙම පාඩමෙන් පහත නිර්ණායක ඔස්සේ ඉදිරිපත් කොට ඇත.

- ජීවන තොරතුරු හා නර්තන සම්ප්‍රදාය
- නර්තන ශිල්පීන්ගේ සුවිශේෂ කුසලතා
- නර්තනයේ ප්‍රවර්ධනයට ලබා දුන් දායකත්වය

# විල්සන් ඔලබොඩුව ගුරුතුමා



## ජීවන තොරතුරු හා නර්තන සම්ප්‍රදායය

කළුතර දිස්ත්‍රික්කයේ ඔලබොඩුව නම් ග්‍රාමයේ ජන්ම ලාභය ලද විල්සන් ප්‍රනාන්දු හෙවත් විල්සන් ඔලබොඩුව මහතා පණිභාරත මහතාගේ නැගණිය වු චිත්‍රා අල්ගම මහත්මිය සමඟ විවහ විය. පහතරට නර්තන සම්ප්‍රදායයේ රයිගම් ශෛලිය ප්‍රගුණ කළ නර්තන හා වාදන ශිල්පියෙකි.

## සුවිශේෂ කුසලතා

නර්තන ශිල්පය මෙන් ම වාදන ශිල්පය පිළිබඳ ව ද අති දක්ෂතා ප්‍රකට කළ මෙතුමා උඩරට හා පහතරට බෙර වාදනය මෙන් ම පෙර අපර දෙදිග විවිධ තූර්ය භාණ්ඩ වාදනය කිරීමේ දක්ෂතා දැක්වූවෙක් විය.

60 දශකයේ මුල් භාගයේ දී රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලය ට (සෞන්දර්ය කලාවිශ්වවිද්‍යාලය) කථිකාචාර්යවරයකු ලෙස පත් වූ මෙතුමාගෙන් පහතරට නර්තන සම්ප්‍රදායයට සිදු වූ මෙහෙය සුළුපටු නොවේ.

විධිමත් ව නොපැවති පහතරට නර්තනයේ හස්ත පාද ක්‍රමවත් ව ගොඩ නැගීම විල්සන් ඔලබොඩුව මහතාගෙන් සිදු වූ එක් මහඟු මෙහෙවරකි.

එවකට එකී ආචාර්ය මණ්ඩලයේ කටයුතු කළ එස්.එල්.එච්.ප්‍රනාන්දු, කේ.ඇස්. ප්‍රනාන්දු සහ සච්රිස් සිල්වා යන අය සමඟ එක් වී පහතරට නර්තනයේ එතෙක් නොපැවති පා සරඹ හා ඉළංගම් සරඹ නමින් සරඹ පද්ධති දෙකක් නිර්මාණය කිරීමේ ගෞරවය ද එතුමාට හිමි විය යුතු ය.

එසේ ම මාතර හා බෙන්තර ශෛලි වශයෙන් පැවති ශුද්ධ මාත්‍රා නැටුමේ පද කොටස් එක් කොට වත්මනෙහි භාවිතයේ පවතින ශුද්ධ මාත්‍රය නිර්මාණය කළේ ද දෙවොල් පද හත හා සුරල් හත ක්‍රමවත් අයුරින් සකස් කළේ ද විල්සන් ඔලබොඩුව මහතාගේ ප්‍රමුඛත්වයෙනි.

තොවිල්පලේ තිබු පහතරට හුදු නැටුම මනා ලෙස වේදිකාවට සකස් කොට ඉදිරිපත් කළ ඔහු කෝළම් නර්තනයේ ජනප්‍රිය කිරීමට ජසලෙන්චිනා නවාංගය සහතව ඉදිරිපත් කළේ ය.

සාම්ප්‍රදායික නර්තන අංග මෙන් ම නව නර්තනාංග කීපයක් ම නිර්මාණය කොට,“රංගලීල” නමින් නර්තන ප්‍රසංගයක් පැවැත්වීම ද පහතරට නර්තන කලාවට එතුමාගෙන් සිදු වූ තවත් මහඟු මෙහෙවරක් ලෙස සැලකිය හැකිය.

# අර්නෝලිස් ඉඹුල්ගොඩ ගුරුතුමා



## ජීවන තොරතුරු හා නර්තන සම්ප්‍රදායය

ඉසෝහාමි හා පොඩි සිංකෙදා යුවළට උපන් දරුවන් දොළොස් දෙනාගෙන් දෙවන පුතා වන අර්නෝලිස් 1925 ගලපිටමඩ ඉඹුල්ගොඩ උපත ලද්දේ ය. 8 වැනි ශ්‍රේණිය දක්වා පාසල් අධ්‍යාපනය ලද අර්නෝලිස් මහතා මංගලතිරිය ගුරුතුමාගෙන් නර්තනය හා ගායනය ප්‍රගුණ කළේ ය. අනතුරු ව අල්ගම කිරිගණිත ගුරුතුමාගෙන් උඩරට නර්තනය හැදෑරූ ඔහු දක්ෂ නර්තන ශිල්පියකු බවට පත් විය.

## සුවිශේෂ කුසලතා

ලංකා ගාන්ධර්ව විභාගය සමත් වී සිටි ඉඹුල්ගොඩ 1951 දී බෙන්තොට ගාමිණී විද්‍යාලයේ නැටුම් උපදේශක ලෙස පත්විය.

මේ අතර ඉන්දියාවට ගිය මොහු ශ්‍රී ගෝපි නාත් යටතේ කතකලි නැටුම පිළිබඳ පුහුණුවක් ලැබීය.තවද රංජනා තංගරාජාගෙන් ඔහු කොළඹ දී භරත නාට්‍යම් ගැන ද අවබෝධයක් ලැබි ය.

රංජනා තංගරාජා යන අය සමග එක් වී

- විජයාවතරණය
- ජානකීහරණය
- උන්මාද චිත්‍රා යන මුද්‍රා නාට්‍යවල රඟ පාන ලදී.

1954 බලපිටිය ගුරු විදුහලේ නැටුම් කථිකාචාර්යවරයකු ලෙස පත් වූ මොහු පසුව 1956 රජයේ ලලිත කලායතනයේ කථාකාචාර්යවරයකු ලෙස කටයුතු කළේ ය. විශ්වවිද්‍යාලයීය ආයතනයක් බවට පත් වූ එම ආයතනයේ ද සේවය කළ ඉඹුල්ගොඩ අතිදක්ෂ උඩරට නර්තන ශිල්පියෙකි. සෙසු නර්තන ශිල්පීන්ට වඩා ඔහුට ම ආවේණික වූ ශෛලියක් අනුව

නර්තනය ගොඩනගා ගැනීම මොහුගේ සුවිශේෂතාවක් ලෙස හැඳින්විය හැකි ය.

මොහු ඉතා දක්ෂ ගායකයෙක් ද වූයේ ය.

උඩරට නර්තන කලාවෙහි ප්‍රාසංගික භාවය ඉස්මතු කරමින් සම්ප්‍රදාය ට හානියක් නොවන සේ නර්තන නිර්මාණයෙහි යෙදෙමින් උඩරට නර්තන කලාවේ ප්‍රගමනයට ශ්‍රේෂ්ඨ දායකත්වයක් ලබාදීමට කටයුතු කළ ශිල්පියෙකි.

මොහුගේ නිර්මාණකරණයේ දී තාලයේ හා රිදමයේ සුසංයෝගයෙන් අපූර්ව සුන්දරත්වයක් මතු කර ගැනීමට සමත් විය. උඩරට නර්තන සම්ප්‍රදායයට අයත් ශාස්ත්‍රීය නර්තන අංග ඒකාකාරී රටාවෙන් බැහැර ව සාම්ප්‍රදායික ලක්ෂණයන්ට සහ එහි අනන්‍යතාවන්ට හානියක් නොවන ආකාරය වඩාත් ආකර්ශනීය ලෙස ඉදිරිපත් කිරීම ද ඔහුගෙන් සිදු වූ තවත් සේවාවක් ලෙස හැඳින්විය හැකි ය.

මෙහි දී භාරතීය නර්තනයේ විවිධ හැඩතල හා රිද්ම එක් කොට නවත ම සජීව නර්තන ශෛලියක් බිහි කළේ ය.

## මෙතුමා විසින් නිර්මාණය කළ මුද්‍රා නාට්‍ය

- 1957 **උදාව** නම් මුද්‍රා නාට්‍යය
- 1961 **වේදනා** නමැති මුද්‍රා නාට්‍යය
- 1968 **රන්දද** නමැති මුද්‍රා නාට්‍යය ද නිෂ්පාදනය කළේ ය.

බෲනායි, තායිලන්තය සහ ජර්මනිය යන රටවල සංචාරය කරමින් උඩරට නැටුමේ අගය ලොවට හෙළි කළේ ය. 1986 දී ඔහු ජනාධිපතිවරයා අතින් **කලාභූෂණ සම්මානය** ද හිමි කර ගත්තේ ය.